# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,194 - 2020 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 962 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 964 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ඔක්තෝබර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

961– B 82059 — 402 (2020/09)

# රජයේ නිවේදන

## සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

### සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

මගීන්, නැව් භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කුලී මෙහෙයුම් සහ විධිමත් ප්‍රවාහන සේවාවක් (International - Charter Operation/ Regular Operation) රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act No.14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසිවලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා කදාන, හල්පෙ මාවත, අංක 33/1 හි පිහිටි ස්පාර්ක් එයාර් (SPARK AIR) විසින් 2020 සැප්තැම්බර් මස 08 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2020 සැප්තැම්බර් මස 09 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනය යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

කපිතාන් රොබට් එල්. ස්පිට්ල්
කපිතාන් මොහොමඩ් රම්සි රහීම්
කපිතාන් සමීන් අත්තනායක
කපිතාන් අශාන් ද අල්විස්
සුරන්ජන් ද සිල්වා මහතා

ස්පාර්ක් එයාර් (පුද්ගලික) ආයතනයේ (SPARK AIR (PRIVATE) LIMITED) එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමණාකාරීත්වය සඳහා කපිතාන් මොහොමඩ් රම්සි රහීම් මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ 4 වන මහලෙයි පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍යය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුලු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂමව වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයඳුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2020 ඔක්තෝබර් මස 20 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතුය.

කපිතාන් තේමිය අබේවික්‍රම,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2020 සැප්තැම්බර් මස 10 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1,
මිනුවන්ගොඩ පාර,
කටුනායක.

09 - 701

**සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

පුද්ගලික ගුවන් මෙහෙයුම් (Private Operations) ගුවනේදී සිදුකරන කාර්යයන් (Aerial Work) සහ අභ්‍යන්තර කුලී මෙහෙයුම් මගින් (Charter Air Service) මගීන්, නැව් භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය රට තුළ පවත්වාගෙන යාම සඳහා සිවිල් ගුවන් සේවා පනත (Act No.14 of 2010) හා ඊට අදාළ රෙගුලාසි හා කොන්දේසිවලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය සහ බලපත්‍රය ලබා ගැනීම සඳහා රත්මලාන, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම (AURA AIRLINES (PVT) LTD) විසින් 2020 සැප්තැම්බර් මස 09 වැනි දතමින් ඉල්ලුම් පත්‍රයක් 2020 සැප්තැම්බර් මස 09 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. ව්‍යාපාරික නාමය ලෙස අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම නමින් හඳුන්වන ආයතනය වෙළඳ නාමය වශයෙන් අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගම යන නම භාවිත කරයි. අයදුම්පතට අනුව අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (AURA AIRLINES (PVT) LTD) අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

ටී. ඒ. සී. වී. තාම්බුගල මහතා.
එස්. එම්. චාන්දනී මිය

අවුරා එයාර්ලයින්ස් (පුද්ගලික) සමාගමේ (AURA AIRLINES (PVT) LTD) යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම සහ කළමණාකාරිත්වය සඳහා ආර්. එම්. එච්. වී. රත්නායක මහතා නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක, සිවිල් ගුවන් සේවා අධිකාරියේ 4 වන මහලේ පිහිටි තාක්ෂණික පුස්තකාලයේ තබා ඇති අතර ඕනෑම වැඩකරන දිනෙක කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍යය ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) ඇතුලු අනෙකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, සිවිල් ගුවන් සේවා පනත ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත් ආරක්ෂිත වූත් කාර්යක්ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2020 ඔක්තෝබර් මස 20 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම්පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කර ගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසිවලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. අන්තර්ගත සියලු ප්‍රකාශනවල නිරවද්‍යතාවය ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශයට අමුණා තිබිය යුතුය.

කපිතාන් තේමිය අබේවික්‍රම,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2020 සැප්තැම්බර් මස 11 වැනි දින,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1,
මිනුවන්ගොඩ පාර,
කටුනායක.

09 - 700

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ඩබ්.ඩී.ආර්.සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2020 ජූලි 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 161 ක ආනයන ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිත වශයෙන්, ප්‍රසිද්ධ නොතාරිස් එම්.එස්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ලියා සහතික කරන ලද අංක 4713 හා 2017 ඔක්තෝබර් 09 වන දින දරන උකස් බැඳුම්කරය මඟින්, ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු ලෙස ඩබ්. ඩී. ආර්. සමරකෝන් රියැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු ලෙස මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කරන ලදී සහ බැඳ තබන ලදී.

ඉහත කී ඩබ්. ඩී. ආර්. සමරකෝන් රියැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනු එකම අධ්‍යක්ෂවරුන් විසින් හිමිකාරිත්වය සහ පාලනය දරනු ලබන සහ එකම අධ්‍යක්ෂවරුන් විසින් හිමිකාරිත්වය දරන එකිනෙකට සම්බන්ධ හවුල්කාරත්ව සමාගම් වේ. ඒ අනුව ඩබ්. ඩී. ආර්. සමරකෝන් රියැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්, එකී පහසුකම්වල සත්‍ය ප්‍රතිලාභීන් වශයෙන්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකම් සඳහා ගෙවීමට බැඳී සිටී.

තවද, ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩබ්. ඩී. ආර්. සමරකෝන් රියැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්, රු.161,000,000 ක ආනයන ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව 2020 පෙබරවාරි 12 වැනි දිනට එකී බැඳුම්කරය මත රුපියල් මිලියන එකසිය අනූ එකයි එක් ලක්ෂ තිස් අට දහස් හැත්තෑ හතරයි ශත හැට පහක (රු. 191,138,074.65) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, රු.161,000,000 ක් වූ හිඟ මුල් මුදල මත එකී රු. 191,138,074/65 ක මුදල, ඒ සඳහා 2020 පෙබරවාරි 13 වන දින සිට විකුණුම් දිනය දක්වා වර්ෂයකට AWPLR + **2.5%** ක අනුපාතයට තවදුරටත් පොලිය ද සහ ප්‍රචාරණ පිරිවැය සහ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 4713 දරන බැඳුම්කරය මඟින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනවල සවිස්තරව දක්වා ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, සංශෝධනය කරන ලද පරිදි 1990 අංක, 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන ) පනත මඟින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කුබුක්කන්දන්වෙල - ඊ488 දරන ග්‍රාම නිලධාරි වසම තුළ කුබුක්කන්දන්වෙල ගමේ පිහිටි "මහකපුයාය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද අංක. 4765 සහ 2009.11.03 වැනි දින දරන පිඹුරේ (ඉඩම් නිරවුල් කිරීමේ ආඥපනත යටතේ සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක.වී.පී. 510 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 389, 390, 392, 393, 394, 395, 396, 397, 398, 399, 401, 402, 404, 405, 406, 407, 412, 413 ඒකාබද්ධ කරන ලද) ලොට් බී වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, වශයෙන් උතුරට : ප්‍රධාන අංක 510 දරන පිඹුරේ ලොට් 355 2/2 ද, නැගෙනහිරට : අංක 510 දරන පිඹුරේ ලොට් 101 සහ 403 ද, දකුණට : අංක 510 දරන පිඹුරේ ලොට් 415,414 සහ 99 සහ බස්නාහිරට : ලොට් 99,411,387,388 සහ 57 ද, මායිම් වූ අක්කර තිස් අටයි රූඩ් තුනයි පර්චස් නමයක් (අ. 38, රූ. 3, පර්. 9) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියලු දේත් වේ.

මෙය මාතලේ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එල් 17/137 යටතේ ලියාපදිංචි කර තිබේ.

**2.** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කුබුක්කදන්වෙල - ඊ488 දරන ග්‍රාම නිලධාරි වසම තුල කුබුක්කන්දවෙල ගමේ පිහිටි "මහකපුයාය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද අංක 4764ඒ සහ 2009.11.02 දින දරන පිඹුරේ (ඉඩම් නිරවුල් කිරීමේ ආඥපනත යටතේ සර්වේ ජනරාල්වරයා විසින් සහතික කරන ලද අංක වී.පී. 510 දරන පිඹුරෙහි දක්වෙන ලොට් $353^{1/2}$, 354, $355^{1/2}$, 356, 357, 358, 360, 361, 362, 363, 364, $368^{1/2}$, $368^{2/2}$, 371, 372, 374, 376, 377, 378, 379, 380, 381, 382, 383, 385, 387, 388, 409, 411 සහ 385 ඒකාබද්ධ කරන ලද) ලොට් ඒ1 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ප්‍රධාන අංක 510 දරන පිඹුරේ ලොට් 355 2/2 ද, නැගෙනහිරට : අංක 510 දරන පිඹුරේ ලොට් 355 2/2, 57, 415, 389 සහ 412 ද, දකුණට : අංක 510 දරන පිඹුරේ ලොට් 389, 412, 99 සහ 386 සහ බස්නාහිරටඃ අංක 510 දරන පිඹුරේ ලොට් 99, 369, 64, සහ 353 2/2 ද මායිම් වූ අක්කර හතළිස් හයයි රූඩ් එකයි පර්චස් තිස් නමයක (අ. 46, රූ. 01, පර්. 39) විශාලත්වයෙන් යුත්

ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියලු දේත් වේ.මෙය මාතලේ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එල් 17/130 යටතේ ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) /
මාණ්ඩලික ලේකම්.

09 - 464/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහනුවර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2020 ජූලි 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 15 ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිත වශයෙන්, ප්‍රසිද්ධ නොතාරිස් කෝලිත එස්. බණ්ඩාර විජේරත්න විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ලියා සහතික කරන ලද අංක. 4646 හා 2016 සැප්තැම්බර් 23 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින්, ඩබ්.ඩී.ආර්.සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු/උකස්කරු ලෙස මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කරන ලදී සහ බැඳ තබන ලදී.

තවද, එකී බැඳුම්කරය සහ රු. 15,000,000 ක වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම එකී ඩබ්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් පැහැර හැර ඇති අතර, ඒ අනුව 2020 පෙබරවාරි 12 වැනි දිනට එකී බැඳුම්කරය මත රුපියල් මිලියන එකොළහයි නම ලක්ෂ විසිනම දහස් විසිපහයි ශත දහනමයක (රු. 11,929,025.19) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති අතර, රු. 10,215,129/33 ක හිඟ මුල් මුදල මත එකී රු. 11,929,025.19 ක මුදල, ඒ සඳහා 2020 පෙබරවාරි 13 වැනි දින සිට විකුණුම් දිනය දක්වා වර්ෂයකට AWPLR + 3.5% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සහ ප්‍රචාරණ පිරිවැය සහ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 4646 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දඹුල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුලත දඹුල්ල නගරය ග්‍රාම නිලධාරි වසම තුල දඹුල්ලේ පිහිටි "දෙහිගහමුල්ලයාය කටුපොත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද අංක 7650 සහ 2007 ජුලි 05 වැනි දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, වශයෙන් උතුරට : ඉග්නේෂස් ප්‍රනාන්දු විසින් හිමිකම්පාන මෙම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : මාතලේ දඹුල්ල මහ පාර ද, දකුණට : ඉග්නේෂස් ප්‍රනාන්දු විසින් හිමිකම් පාන මෙම ඉඩමේ කොටසක් සහ බස්නාහිරට : අහමඩ් විසින් හිමිකම්පාන මෙම ඉඩමේ කොටසක් ද මායිම් වූ පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) හෝ හෙක්ටයාර් 0.0253ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියලු දේත් වේ. මෙය මාතලේ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම ජී /පත්ඉරුව එල් /54/93 හි ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) /
මාණ්ඩලික ලේකම්.

09 - 464/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පාදුක්ක ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

සිහත් හවුසින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2020 ජූලි මස 23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට ලියා සහතික කරන ලද අංක 2748 හා 2016.07.15 වැනි දින දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම, ණයකරු වශයෙන් සිහත් හවුසින් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති අතර, ඒ අනුව 2020 පෙබරවාරි 16 වැනි දිනට රුපියල් මිලියන තිස් දෙකයි තුන් ලක්ෂ හතලිස් තුන් දහස් හයයි ශත අසූ හය (රු. 32,343,006.86) ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින්, 2020 පෙබරවාරි 17 වැනි දින සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළිය ද සමඟ රුපියල් මිලියන තිස් දෙකයි තුන් ලක්ෂ හතලිස් තුන් දහස් හයයි ශත අසූ හයක (රු. 32,343,006.86) එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ මුදල් ලැබෙනතුරු දරන ලද අනෙකුත් ගාස්තු, ගෙවීම් (ඇත්නම්) අඩුකොට අයකරගැනීම සඳහා එකී අංක 2748 දරන බැඳුම්කරය මඟින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන ) පනත මඟින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරලේ, තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව ඇතුලත නාරාහේන්පිට ග්‍රාම නිලධාරි වසම තුල නාරාහේන්පිට පිහිටි වරිපනම් අංක 131/3, ඇල්විටිගල මාවත දරන ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1109 සහ 1992 මැයි 10 වැනි දින දරන (වඩාත් නිවැරදිව 1991 නොවැම්බර් 19) පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, වශයෙන් උතුරට : මෙහි ලොට් ආර්3 ද, නැගෙනහිරට : වරිපනම් අංක ජී117- ඇල්විටිගල මාවත දරන පරිශ්‍රය ද, දකුණට : මෙහි ලොට් 5 සහ බස්නාහිරට : මෙහි ලොට් ආර්2 ද මායිම් වූ පර්චස් දොලහයි දශම හතරයි හතර (අ. 0, රූ. 0, පර්. 12.44) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුල පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේත් වේ. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 111/21 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) /
මාණ්ඩලික ලේකම්.

09 - 464/3

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පිඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පිඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2020 ජූලි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අබේවික්‍රම විසින් සහතික කරන ලද 2018.04.18 දිනැති අංක 2063 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ PV 17612 අංකයෙන් යථා පරිදි සංස්ථාගත කරන ලද (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) සිය ලියාපදිංචි කාර්යාලය තංගල්ලේ පවත්වාගෙන යන දර්ශන ඩිජිටල් කලර් ලැබ් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2020 ජුනි 30 වැනි දිනට එකී දර්ශන ඩිජිටල් කලර් ලැබ් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 2063 දරන උකස් බැඳුම්කරය මත රුපියල් අනූ පන් ලක්ෂ හැත්තෑ නව දහස් පනස් නවයයි ශත විසි හයක (රු. 9,579,059/26) මුදලක් ද, 2020 ජූලි මස 01 වැනි දින විකිණීමේ දිනය දක්වා රුපියල් අනූ ලක්ෂයක (රු. 9,000,000) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතික (AWPR) ඉහළ වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතිකය මත වන පොලිය ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් අනූ පන් ලක්ෂ හැත්තෑ නව දහස් පනස් නවයයි ශත විසි හයක (රු.9,579,059.26) මුදලක් ද, 2020 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් අනූ ලක්ෂයක (රු. 9,000,000) මුදල මත සෑම මසකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ඉඩම සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලී අනුපාතිකට (AWPR) ඉහළින් වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) බැගින් වූ අනුපාතිකය මත වන පොලිය ද හෝ විකිණීමේ අවස්ථා දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා පහත විස්තර කරනු ලබන ඉඩම සහ පරිශ්‍රය එහි අඩංගු සියලු දේ සමග විකුණා අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාවන) පනතේ 13 වන නියමයන් යටතේ උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැයකර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2036 දරන උකස් බැඳුම්කරය මගින් කොකු හැන්නදිගේ දර්ශන දේශප්‍රිය යන අය විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර

කරනු ලබන ඉඩම සහ පරිශ්‍රය එහි අඩංගු සියලු දේ සමග තුසිත් කරුණාරත්න බලයලත් වෙන්දේසිකරු ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 2063 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තංගල්ල ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත පල්ලිකුඩාව ග්‍රාමීය (274) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගොයම්බොක්ක පිහිටි, සිරිකඳුරෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් මැන සකස් කරන ලද 1985.07.21 දිනැති අංක 3052A දරන පිඹුරේ ලොට් 15 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 16 ද, නැගෙනහිරට : කුටුඅද්දරහේන ද, දකුණට : එම ඉඩමේ ලොට් 14 ද, බස්නාහිරට : මුල් ඉඩමේ ලොට් 9 (පාර) ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් හයක් (අ. 0, රූ. 0, පර්. 36) විශාල ඉඩම සහ එහි පිහිටි පස සියලු වැවිලි සහ ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ.

බලයලත් මිනින්දෝරු එස්.එල්.ගලප්පත්ති විසින් මැන සකස් කරන ලද 1995.08.31 දිනැති අංක 4659A දරන පිඹුරට අනුව ඉහත කී කොටස පහත දක්වෙන පරිදි විස්තර කෙරේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, ගොයම්බොක්ක පිහිටි, සිරිකඳුරෙවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් මැන සකස් කරන ලද 1995.08.31 දිනැති අංක 4659A දරන පිඹුරේ ලොට් 15 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 16 ද, නැගෙනහිරට : කුටුඅද්දරහේන ද දකුණට : එම ඉඩමේ ලොට් 14 ද, බස්නාහිරට : මුල් ඉඩමේ ලොට් 9 (පාර) ද වශයෙන් මායිම් වූ එකී අංක 4659A දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් තිස් හයක් (අ. 0, රූ. 0, පර්.36) හෙවත් හෙ.0.0912 ක් විශාල ඉඩම සහ එහි පිහිටි පස සියලු වැවිලි සහ ගොඩනැගිලි ඇතුලු සියලු දේ වේ.

එකී ඉඩමේ ලොට් 26 (අඩි 15ක් පළල පාර) සහ මුල් ඉඩම් ලොට් 9 (අඩි 20ක් පළල පාර) මතින් සහ ඔස්සේ වන මාර්ග අයිතිය, අනෙකුත් භාවිත කරන්නන් සමග පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

09 - 453

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එච්. එම් ඒ පී ජයරත්න සහ කේ අයි හෙට්ටිආරච්චි.
ගිණුම් අංක : 1140 5766 1194.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. ආර්. උදයංග යන අය විසින් ලියා සහතික කරන ලද 2108 අගෝස්තු 29 දාතම හා අංක 525 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හේරත් මුදියන්සේලාගේ අමිල ප්‍රසාද් ජයරත්න සහ කල්පනී ඉරන්ති හෙට්ටිආරච්චි යන අය බන්ධනදයි වශයෙන් හා එකී හේරත් මුදියන්සේලාගේ අමිල ප්‍රසාද් ජයරත්න යන අය උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක, 525 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක් කෝටි විසිඑක් ලක්ෂ අසූ දහස් හයසිය අනූ හයයි ශත දෙකක (රු. 12,180,696.02) මුදලක් 2020 ජුනි 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක් කෝටි විසිඑක් ලක්ෂ අසූ දහස් හයසිය අනූ හයයි ශත දෙකක (රු. 12,180,696/02) මුදල ද, 2020 ජුනි 26 වැනි දින සිට අංක 525 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දොළොස් ලක්ෂ එකොලොස් දහස් තුන්සිය අසූවයි ශත විසි නමයක (රු. 11,211,380/29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 525 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී කේ ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (වකේ උප කාර්යාලය) වකේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය කොට්ඨාසයේ සහ මිල්ලතේ - 386 ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ උඩගම ග්‍රාමයේ පිහිටි '' උඩුමුල්ලවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස් එම් චන්ද්‍රසිරි යන අය විසින් සාදන ලද 2009 සැප්තැම්බර් මස 13 දාතම හා අංක 4066 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 20A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 18, නැගෙනහිරටඃ මෙම ඉඩමේ ලොට් 59 (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 23, බස්නාහිරට : සංඝමිත්ත විද්‍යාලයේ ඉඩම සහ මෙම ඉඩමේ ලොට් 18 යන මායිම්, තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම පහක් (A :0 R:0 P:14.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ අංක 4066 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 59/03 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

09 - 468

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් යෝජනාව විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් උපේකා පියුමාලි කුමාරි තෙන්නකෝන් විසින් සහතික කරන ලද අංක 193 සහ 2018.01.18 වැනි දින දරන උකස් බැඳුම්කරය මඟින් ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස්කොට ඇපයට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය. එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/පහසුකම් ගෙවා පියවා දැමීම.කෑගල්ලේ පදිංචි කුරුප්පු ආරච්චිගේ ගිහාන් දනුෂ්ක වීරසිංහ සහ දිල්ෂා නිමන්ති කැටවලකුඹුර (ණය ගැණුම්කරුවන්) යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

එකී දිල්ෂා නිමන්ති කැටවලකුඹුර යන අය විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සහ පරිශ්‍රයේ ඇයගේ සින්නක්කර අයිතිය හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 193 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී බැඳුම්කරය මත 2019 ජූලි මස 31 වැනි දිනට රුපියල් හැත්තෑතුන්ලක්ෂ හැටදෙදහස් එකසියහතරකුත් ශත පනස්හයක (රු. 7,362,104.56) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (මෙහි මින්මතු සාමූහික වශයෙන් එකී ප්‍රධාන පනත ලෙස හඳුන්වන.) යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින් ඉහත කී අංක 193 දරන බැඳුම්කරය මගින්

ඇප තබන ලද සහ එකී අංක 193 දරන බැඳුම්කරය මත එකී බැංකුවට අයවිය යුතු රුපියල් හැත්තෑතුන්ලක්ෂ හැටදෙදහස් එකසියහතරකුත් ශත පනස්හයක (රු. 7,362,104.56) මුදල හෝ එකී දේපළ විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව රුපියල් හැටදෙලක්ෂ දහනවදහස් අනූහතකුත් ශත පනස්නවයක (රු.6,219,097.59) මුදල මත 2019 අගෝස්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට තිහ (30%) බැගින් පොලිය සහ තව ද, ප්‍රචාරණ වියදම් සහ දේපල විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී බැඳුම්කරය මගින් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළයේ, මොනරාගල පත්තුවේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු කුණ්ඩසාලේ ග්‍රාම නිලධාරි වසමේ හේන්වල පිහිටි ගොවිපොලවත්ත නමැති ඉඩමට මිනුම්පති විසින් මැන සාදන ලද අංක මහ 3578 සහ 1991 මාර්තු මස 01 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 37 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ නිරූපිත ලොට් 09 සහ 34 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් 34 සහ අංක මහ 287 දරන මූලික පිඹුරේ නිරූපිත ලොට් 1 ද , දකුණට : අංක මහ 287 දරන මූලික පිඹුරේ නිරූපිත ලොට් 1 සහ මෙම පිඹුරේ ලොට් 38 ද, බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 38 සහ 9 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක මහ 3578 දරන පිඹුර අනුව හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි හයයි හතරක් (හෙක්.0.064) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමඟ සහ ඉහත කී පිඹුරේ නිරූපිත සියලු

ප්‍රවේශ මාර්ග භාවිත කිරීමේ අයිතිය ද සමග වන අතර, තව ද, මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 647/234 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී මහ 3578 දරන පිඹුරේ නිරූපිත ලොට් 37 සම්බන්ධයෙන් මෑතකාලීනව සිදුකළ නැවත මැන බෙද වෙන් කිරීමට අනුව එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළයේ, මොනරාගල පත්තුවේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු කුණ්ඩසාලේ ග්‍රාම නිලධාරි වසමේ හේන්වල පිහිටි ගොවිපොලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ.කේ.කේ.ඒකනායක විසින් මැන සාදන ලද අංක 1521 සහ 2017 ඔක්තෝබර් මස 22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : මිනුම්පති විසින් මැන සාදන ලද අංක මහ 3578 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 සහ පාර ද, නැගෙනහිරට : මිනුම්පති විසින් මැන සාදන ලද අංක මහ 3578 දරන පිඹුරේ නිරූපිත ලොට් 34 ද, දකුණට : අංක මහ 287/1 දරන මූලික පිඹුරේ නිරූපිත ලොට් 1 ද, බස්නාහිරට: මිනුම්පති විසින් මැන සාදන ලද අංක මහ 3578 දරන පිඹුරේ නිරූපිත ලොට් 38 ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1521 දරන පිඹුර අනුව පර්චස් විසිහතරකුත් දශම තුනයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 24.30) හෙවත් හෙක්ටයාර 0.0614 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි පළතුරු ආදී සෑම සියළු දේත් සමඟ සහ ඉහත කී අංක මහ 3578 දරන පිඹුරේ නිරූපිත සියලු ප්‍රවේශ මාර්ග භාවිත කිරීමේ අයිතිය ද සමඟය.

තව ද, මෙහි සවිස්තරව දැක්වෙන ඉඩමේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇදනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ විදුලි සැපයුම් පද්ධති, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ සේවා උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

09 - 499

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.